# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2021 = 100) : 2023 පෙබරවාරි


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk


ජාතික පාරිභෝගික මිල දර්ශකයේ 2013=100 වූ දර්ශක යොමු කාලය 2023 ජනවාරි මාසයේ සිට 2021=100 වන නව දර්ශක යොමු කාලයට යාවත්කාලීන කර ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2023 පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 53.6%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2023 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 53.2%ක් ලෙස වාර්තා විය. 2023 පෙබරවාරි මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 22.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ 31.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. 2022 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2023 පෙබරවාරි මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම් ය. කෙසේ වෙතත් ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) 2023 ජනවාරි මාසයේදී 53.6% සිට 2023 පෙබරවාරි මාසයේදී 49.0% දක්වා අඩුවූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය)2023 ජනවාරි මාසයේදී 52.9% සිට 2023 පෙබරවාරි මාසයේදී 57.4% දක්වා වැඩිවිය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2021=100) මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2023 ජනවාරි මාසයේ 201.8ක් වූ දර්ශකාංකය 2023 පෙබරවාරි මාසයේ දී 204.1ක් දක්වා වැඩිවීමක් වාර්තා විය.පසුගිය මාසය හා සංසන්දනය කල විට 2023 පෙබරවාරි මාසයේ දර්ශකාංකය 2.3ක වැඩිවීමක් එනම් 1.13ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.93% කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 2.06% කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට එළවළු, හාල්, බිත්තර, ලොකුළූණු, රතුළූණු, අර්තාපල්, මයිසූර් පරිප්පු, පාන්(සාමාන්‍ය), මිරිස්කුඩු, කරවල,තිරිඟුපිටි, අළුත් මාළු, වියළි මිරිස්, බනිස්, අමුමිරිස්, ටින්මාළු හා දෙහි යන ආහාර ද්‍රව්‍යවල මිලෙහි අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් පොල්, තේ කොළ/කුඩු, අළුත් පළතුරු, මුංඇට, පොල්තෙල්, සීනි, හරක් මස් හා සෝයාමීට් යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2023 පෙබරවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' , 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' (විදුලිය හා ගෑස්) , 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'ප්‍රවාහන' (පෙට්‍රල්) සහ 'විවිධ භාණ්ඩ හා සේවා' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික' සහ 'අධ්‍යාපන' යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිලෙහි සුළු වැඩිවීමක් වාර්තා වී ඇත. එමෙන්ම 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩයට අයත් අයිතමයන්ගේ මිලෙහි සුළු අඩුවීමක් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (පාද වර්ෂය: 2021=100) ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිබිඹු වන යටිදැරි උද්ධමනය (Core Inflation), 2023 ජනවාරි මාසයේ 52.0% සිට 2023 පෙබරවාරි මාසයේදී 50.1% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2021 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2022 | පෙබ. | 132.9 | 153 | 119.8 | 126.2 | 0.9 | 1.0 | | | | |
| | මාර්තු | 137.3 | 157 | 124.6 | 130.4 | 3.3 | 3.3 | | | | |
| | අප්‍රේල් | 151.7 | 176 | 136.0 | 142.8 | 10.5 | 9.5 | | | | |
| | මැයි | 166.3 | 195 | 147.6 | 154.5 | 9.6 | 8.2 | | | | |
| | ජූනි | 183.5 | 222.8 | 158.2 | 167.5 | 10.3 | 8.4 | | | | |
| | ජූලි | 193.1 | 233.4 | 167.1 | 176.8 | 5.2 | 5.6 | | | | |
| | අගෝ. | 197.7 | 237.5 | 171.9 | 181.2 | 2.4 | 2.5 | | | | |
| | සැප්. | 201.9 | 239.1 | 178.0 | 185.9 | 2.1 | 2.6 | | | | |
| | ඔක්. | 201.6 | 236.5 | 179.1 | 188.0 | -0.1 | 1.1 | | | | |
| | නොවැ. | 200.3 | 233.2 | 179.1 | 187.8 | -0.6 | -0.1 | | | | |
| | දෙසැ. | 200.4 | 232.4 | 179.8 | 188.0 | 0.0 | 0.1 | | | | |
| 2023 | ජන. | 201.8 | 232.8 | 181.8 | 189.8 | 0.7 | 1.0 | 53.2 | 53.6 | 52.9 | 52.0 |
| | පෙබ. | 204.1 | 228.1 | 188.6 | 189.4 | 1.1 | -0.2 | 53.6 | 49.0 | 57.4 | 50.1 |